③

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2181/28 - 2020 ජුනි මස 26 වැනි සිකුරාදා - 2020.06.26

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ, 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර නාගරික සංවර්ධන, ජල සම්පාදන හා නිවාස පහසුකම් අමාත්‍ය, මහින්ද රාජපක්ෂ වන මම, එකී මණ්ඩලයට ගම්පහ, අත්තනගල්ල හා මීනුවන්ගොඩ ඒකාබද්ධ ජල සම්පාදන ක්‍රමය යටතේ බස්නාගොඩ ජලාශය නිසා බලපෑමට ලක්වන ජනතාව නැවත පදිංචි කිරීමට යෝජිත ඉඩම සඳහා ප්‍රවේශ මාර්ග සකස් කිරීමට ඉඩම් කොටසක් අත්කර ගැනීමට අවශ්‍ය වී ඇති හෙයින් මෙහි පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩම් කොටසේ නිශ්චල දේපළ අයිතිය අත්කර ගැනීම මේ නියමයෙන් අනුමත කරමි.

මහින්ද රාජපක්ෂ,
නාගරික සංවර්ධන, ජල සම්පාදන හා නිවාස පහසුකම් අමාත්‍ය.

2020 ජුනි මස 15 වැනි දින,
අංක 35, ලක්දිය මැදුර,
නව පාර්ලිමේන්තු පාර,
පැලවත්ත,
බත්තරමුල්ල,
නාගරික සංවර්ධන, ජල සම්පාදන සහ නිවාස පහසුකම් අමාත්‍යාංශයේ දී ය.
5/3/GQ/02

*උපලේඛනය*

ගම්පහ දිස්ත්‍රික්කයේ, අත්තනගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 363, වැලිකඩමුල්ල ග්‍රාම නිලධාරී වසමේ වැලිකඩමුල්ල ගමේ පිහිටි මේ සමග එවන අංක ගම් 4160 දරන මූලික පිඹුරේ කැබලි අංක 5 ලෙස පෙන්නුම් කෙරෙන ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.1098ක් පමණ වන සපුගස්ඕවිටවත්ත පාර නමැති ඉඩමෙන් පහත සඳහන් මායිම් තුළ පිහිටි ඉඩම් කොටස

*උතුරට* : පාර, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව හිමිකම් කියන හපුගහඕවිට, හපුගහඕවිටකුඹුර සහ වැටකෙයාපොතකුඹුර සහ කැබලි අංක 6 ;

1A - G 32396 — 28 (2020/06)
*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**උපලේඛනය** (සම්බන්ධිතයි)

| | | |
|---|---|---|
| *නැගෙනහිරට* | : | ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව හිමිකම් කියන හපුගහඹිවිට, හපුගහඹිවිටකුඹුර සහ වැටකෙයාපොතකුඹුර සහ කැබලි අංක 2 ; |
| *දකුණට* | : | 2 වැනි බිම් කැබැල්ල ; |
| *බටහිරට* | : | මාර්ගය (පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය), ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව හිමිකම් කියන හපුගහඹිවිට, හපුගහඹිවිටකුඹුර සහ වැටකෙයාපොතකුඹුර සහ කැබලි අංක 7 |

*ඉඩමට හිමිකම් කියන්නාගේ නම සහ ලිපිනය* : 01. ප්‍රාදේශීය සභාව,
අත්තනගල්ල.

07 - 329

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.